ත්‍රිකුණාමලය නගර සභාව

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ත්‍රිකුණාමලය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූල ධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොළී රු.2,337,793 ක් ආදායම් ගිණුම් රු.3,532,041 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය පරික්ෂාව අදාල පොලී ආදායම් පමණක් ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගෙන ඇත. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දින සිදු කළ භාණ්ඩ සමීක්ෂණය අනුව, රු.16,485,867 ක් වූ පොදු ගබඩා අයිතමයන්ගේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.16,939,665 ක් ලෙස ඉදිරිපත් කර තිබුණි. මේ නිසා, පොදු ගබඩා අයිතමයන්ගේ වටිනාකම රු.453,798 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල මෙය ගැලපිය යුතු වේ. | පිළිගෙන ඇත. |
| (ඇ) | සේවක ණය ලේඛනය අනුව, සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති රු.21,316,765 ක් වූ හිඟ ණය ශේෂය මූල්‍ය ප්‍රකාශනවල රු.20,578,220 ක් ලෙස දක්වා තිබුණි. එම නිසා සේවක ණය ශේෂය රු.729,545 කින් අඩු වී තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල මෙය ගැලපිය යුතුවේ. | පිළිතුරු ලබා දෙනු ලැබේ. |
| (ඈ) | ලැබිය යුතු 2018 වර්ෂයට අදාල තානායම් ආදායම් රු.1,103,310 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙනැවිත් නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල මෙය ගැලපිය යුතු වේ. | පිළිගෙන ඇත. |
| (ඉ) | 2018 දෙසැම්බර් 31 දිනට පැවති ආයුර්වේද මධ්‍යස්ථානයේ පැවැති වටිනාකම | මූල්‍ය ප්‍රකාශනවල මෙය ගැලපිය යුතු වේ. | පිළිගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| | රු.132,098 ක් වූ ඖෂධ අවසාන තොගය මූල්‍ය ප්‍රකාශන ගෙනැවිත් නොතිබුණි. | | |
| (ඊ) | සභාව විසින් ඉදිකළ පිරිවැය රු.16,887,724 ක් වූ ශ්‍රවනාගාරය සහ ඉන්ධන පිරවුම්හල් ගොඩනැගිලි මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි. | වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතු වේ. | පිළිගෙන ඇත. |
| (උ) | වෙළඳපොළ සංකීර්ණය, සායන මධ්‍යස්ථානයනහි ගිනි නිවීම ඒකකය (Fire Brigade) වැඩි ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතු වේ. | පිළිගෙන ඇත. |
| (ඌ) | සේවක වැටුප් හා සභිකයන්ගේ දීමනා වශයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු එකතුව රු.9,175,086 ක් ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතු වීම. | පිළිගෙන ඇත. |
| (එ) | 2018 දෙසැම්බර් මාසයට අදාල මුද්දර ගාස්තු ආදායම් රු.27,594,787 ක් සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතු වීම. | පිළිගෙන ඇත. |
| (ඒ) | මුදල් පොත අනුව බැංකු ශේෂය රු.15,662,595 ක් වුවත, මූල්‍ය ප්‍රකාශනවල එය රු.14,397,452 ක් ලෙස දක්වා තිබුණි. එම නිසා, බැංකුවේ ඇති මුදල් රු.1,265,143 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතු වේ. | පිළිගෙන ඇත. |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේදී විවිධ ආයතන 08 කට අදාලව ගෙවිය යුතු රු.869,604 ක් ගෙවා නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගෙන ඇත. |

### 1.3.2 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 1 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අවිනිෂ්චිත ගිණුම් බැර ශේෂය රු.11,863,654 ක් වූ නමුත්, ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳ සොයා බලා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකර අවිනිශ්චිත ගිණුම් නිරවුල් කල යුතු වේ. | පිළිගෙන ඇත. |

## 1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

### තොරතුරු ඉදිරිපත් නොකිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම් එකතුව රු.346,062,670 ක් වූ ගිණුම් විෂයයන් 18 කට අදාලව දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස තහවුරු කළ නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. | |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ 177 (2) වගන්තිය | සෑම මුදල් වර්ෂකම මාර්තු 01 දිනට හෝ ඊට ප්‍රථම මූල්‍ය ප්‍රකාශනයේ සාරාංශ ගැසට් පත්‍රයේ පල කල යුතුය. එසේ වුවත්, සභාව විසින් මෙම අවශ්‍යතාවය අනුගමනය කර නොතිබුණි. | විධිවිධානවලට අනුකූල විය යුතු වේ. | පිළිගෙන ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලසි 371 (5) | සභාවේ නිලධාරීන්ට හා බාහිර පාර්ශවයන්ට ලබාදුන් අත්තිකාරම් රු.6,277,800 ක් නිරවුල් කිරීමට හෝ ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විධිවිධානවලට අනුකූල විය යුතු වේ. | පිළිගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක් ඉක්මවූ පැරණි තැන්පතු රු.18,025,855 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | විධිවිධානවලට අනුකූල විය යුතු වේ. | පිළිගෙන ඇත. |
| | (iii) මුදල් රෙගුලාසි 880 | නිලධාරීන් 07 දෙනෙකු විසින් ඔවුන් වෙනුවෙන් සේවක ඇප තැන්පතු තබා නොතිබුණි. | විධිවිධානවලට අනුකූල විය යුතු වේ. | පිළිගෙන ඇත. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහනවල ඉන්ධන පරික්ෂාව සභාව සතු වාහන 43 ක් සඳහා සිදුකර නොතිබුණි. | චක්‍රලේඛයට අනුකූල විය යුතුය. | පිළිගෙන ඇත. |
| (ඈ) | 2002 නොවැම්බර් 11 දිනැති අංක IAI/2002/02 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. | චක්‍රලේඛයට අනුකූල විය යුතුය. | පිළිගෙන ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු16,434,872 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 21,109,142 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-------------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| බදු | 43,420 | 41,077 | 41,080 | 99,802 | 43,480 | 35,188 | 24,971 | 16,035 |
| කුලී | 30,707 | 21,205 | 21,129 | 26,968 | 20,104 | 21,482 | 16,466 | 5,015 |
| බලපත්‍ර ගාස්තු | 5,275 | 5,175 | 5,175 | - | 4,500 | 4,442 | 4,442 | - |
| වෙනත් ආදායම් | 49,663 | 27,623 | 27,624 | 336 | 61,525 | 17,927 | 17,927 | - |

**2.2.2 කඩ කුලී**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කඩකාමර කුළියට දුන් 2016 වර්ෂයේදී කුලී හිමියන්ගෙන් නියෝගයක් අනුව හිඟ කඩ කුලී වෙනුවෙන් රු.689,734 ක් ලැබී තිබුණු අතර එම මුදලම හිඟ කඩ කුලී වලින් අඩුකර තිබුණි. කෙසේ වුවද, එම කඩ කාමර කුළියට ලබාගත් කුලී හිමියන්ගෙන් අයවිය යුතු එම හිඟ කඩකුලී වටිනාකම අඩු කිරීම සඳහා ඔවුන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. මේ නිසා අදාල කඩ කුලී හිමිකරුගෙන් හිඟ මුදල් අයකර ගෙන තිබුණද, ඔවුන්ගේ හිඟ කඩ කුලී ඉදිරියට ගෙනැවිත් තිබුණි. | කඩකුලී අයකිරීමේදී තනි තනිව හඳුනාගත හැකි අයුරින් විධිමත්ව ලේඛන පවත්වා ගත යුතු වේ. | පිළිතුරු ලබාදෙනු ලැබේ. |

**2.2.3 උසාවි දඩ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නැගෙනහිර පළාත් සභාවේ පළාත් භාණ්ඩාගාරයෙන් 2018 වර්ෂයට අදාප උසාවි දඩ ආදායම් මුළු වටිනාකම හඳුනාගෙන කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු උසාවි දඩ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගෙන ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

නගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන කාර්යයන් සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 40 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතු වේ. | පිළිගෙන ඇත |

පැනවිය යුතුව තිබුණි. එසේ වුවත්, 2018 වර්ෂය සඳහා නීතින් හා රීතීන් කිසිවක් පනවා නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි සභාව විසින් 2018 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | පිළිතුරු ලබාදෙනු ලැබේ. |

(ඇ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | රජයේ ආයතන සහ පාසැල් වැනි සභා බල ප්‍රදේශයේ පොදු ස්ථානවල පවතින ප්ලාස්ටික්, පොලිතීන්, කඩදාසි, දිරන අපද්‍රව්‍ය සහ වීදුරු වශයෙන් වෙන්කර තැබීමේ පරමාර්ථයෙන් PSDA සහ යොවුන්පුරය වැඩසටහන - 2017 යටතේ කසල බඳුන් 664 ක් රු.3,160,799 කට මිලදී ගෙන තිබුණි. මහජනයා ගැවසෙන පොදු ස්ථාන සහ රජයේ ආයතන සඳහා කසල බඳුන් 240 න් නගර සභාව විසින් නිකුත් කර තිබුණි. විගණකයින් විසින් සිදුකළ නියැදි පරීක්ෂාවකදී එකම පාටකින් සලකුණු කර නොමැතිව (Label අලවා නොමැතිව), වෙන්කිරීමකින් තොරව ඉවතලන අපද්‍රව්‍ය සඳහා සැපයූ කසල බඳුන් පාර සහ සභා පරිශ්‍රයේ තබා තිබීම නිරීක්ෂණය විය. කෙසේ වුවද, රු.909,450 ක් වටිනා කසල බඳුන් 230 ක් අවශ්‍යතාවය පිළිබඳ අවධානය යොමු නොකොට, විධිමත් බෙදා හැරීමේ සැලැස්මක් හා නඩත්තු කිරීමක් නොමැතිවීම නිසා 2019 මැයි 17 දින වන විට නිෂ්කාර්යව පැවතුණි. | කසල බඳුන් සැලැස්මක් අනුව භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පිළිතුරු ලබාදෙනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | සභා බල ප්‍රදේශයේ පවතින නිවාසවලින් ඉවතලන ප්ලාස්ටික්, පොලිතීන්, කඩදාසි, වීදුරු සහ දිරන අපද්‍රව්‍ය රැස්කිරීම සඳහා නගර සභා අරමුදලෙන් කසල මළු 40,000 ක් රු.1,530,800 කට මිලදී ගෙන තිබුණි. අපද්‍රව්‍ය වෙන්කිරීමේ වැදගත්කම පිළිබඳව දැනවත් කිරීමේ වැඩසටහන් නොමැතිවීම නිසා රු.993,787 ක් වටිනා කසල මළු 27,994 ක් 2019 මැයි 17 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | කසල වෙන් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පිළිතුරු ලබාදෙනු ලැබේ. |

(ඇ) **පාරිසරික ගැටළු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 1980 අංක 47 දරන ජාතික පරිසර පනත ප්‍රකාරව, සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන, වඩු කර්මාන්ත, ගරාජ් සහ වී මෝල් ආදී ව්‍යවසායන් ක්‍රියාත්මක කිරීමේදී නගර සභාවෙන් පරිසර රක්ෂණ බලපත්‍ර ලබාගත යුතුය. කෙසේ වුවද, එවැනි පාරිසරික බලපත්‍ර කිසිවක් ලබාගැනීමකින් තොරව ඉහත ආයතන ක්‍රියාත්මක වෙමින් පැවතුණි. | සමීක්ෂණයක් පවත්වා පාරිසරික බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබාදෙනු ලැබේ. |
| (ii) | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් කින්නියා ප්‍රදේශයේ එළිමහන් ඉඩමක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වාර්ෂිකව එකතු කරනු ලබන ටොන් 19,350 ක් පමණ වන කසල අවිධිමත් ලෙස බැහැර කර තිබුණි. මේ මගින් වැසි කාලයේදී පාරිසරික ගැටළු මතු වී තිබුණු අතර, වන සතුන්ගේ පැවැත්මටද තර්ජනයක් වී තිබුණි. | පරිසර ගැටළු මතු නොවන ආකාරයට කසල බැහැර කිරීමේ කටයුතු විධිමත් සිදුකිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාබල ප්‍රදේශයේ අඩු බර සහිතව 2015, 2016, 2017 සහ 2018 වර්ෂවලදී ඉපදුනු දරුවන් පිළිවෙලින් 8.87 %, 9.46% ක්, 10.9% ක් සහ 10.1 ක් වූ අතර සභාව විසින් මෙම ප්‍රතිශතය අවම කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. | අඩුබර උපත් සංඛ්‍යාව අවම කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දෙනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නගර සභා නිල නිවාසවල පදිංචි (quarters) නිලධාරීන් 40 දෙනෙකුගෙන් වර්ෂ කිහිපයක සිට කුලී නොගෙවීමක් රු.663,935 ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ හිටව තිබුණි. කෙසේ වුවද, මෙම හිඟ කුලී අයකිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ කුලී අයකිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දෙනු ලැබේ. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.3 වගන්තිය අනුව රජයේ නිලනිවාස භාවිතා කළ හැක්කේ රජයේ නිලධාරීන්ට පමණි. කෙසේ වෙතත්, පුද්ගලික පාර්ශවයක් සඳහා සභාවේ නිලනිවාස 05 ක් ලබාදී තිබුණි. | ඔවුන් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | පිළිතුරු ලබා දෙනු ලැබේ. |
| (ඈ) | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.3 වගන්තිය අනුව රජයේ නිලනිවාස ලබාදිය හැක්කේ උපරිම වර්ෂ 05 ක් සඳහා පමණි. එසේ වුවද, සභාව විසින් වර්ෂ 05 කට අධික කාලයක සිට නිලධාරීන් 17 දෙනෙකු සඳහා රජයේ නිලනිවාස ලබාදී තිබුණි. | ආයතන සංග්‍රහය අනුගමනය කළ යුතු වේ. | පිළිතුරු ලබා දෙනු ලැබේ. |
| (ඉ) | සභාවට අයත් වාහන 13 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් බලපත්‍ර ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දෙනු ලැබේ |
| (ඊ) | නගර සභා ආඥා පනතේ 164 (2) වගන්තිය ප්‍රකාරව, නගර සභා බලප්‍රදේශයේ ක්‍රියාත්මක වන සංචාරක හෝටල්වලින් එම හෝටල්වල මුළු ආදායමෙන් බදු අයකළ යුතුය. කෙසේ වෙතත්, 2017/2018 මූල්‍ය වර්ෂය සඳහා සංචාරක හෝටල් 03 කින් බදු අයකර ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. මේ නිසා සභාවට සෑම වර්ෂයකම ආසන්න වශයෙන් රු.350,000 ක ආදායමක් අයකර ගත නොහැකි වී තිබුණි. | බදු අයකර ගත යුතු වේ. | පිළිතුරු ලබා දෙනු ලැබේ |
| (උ) | 2017 මැයි මාසයේ සිට හිඟ හිටිව පැවති තානායම් ගාස්තු රු.1,838,850 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගත යුතු වේ. | පිළිතුරු ලබා දෙනු ලැබේ |
| (ඌ) | වර්ෂ 01 සිට 10 ක් දක්වා කාලයක සිට හිඟ හිටිව පැවති | හිඟ මුදල් අයකර ගත යුතු වේ. | පිළිතුරු ලබා දෙනු ලැබේ |

හිඟ වෙළඳ කඩකුලී එකතුව රු.29,832,841 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

### 3.3 මානව සම්පත් කළමනාකරණය

සේවක පුරප්පාඩු සහ අතිරික්තයන්, විනය ක්‍රියාමාර්ග, සේවක ණය, සේවක ඇප ආදිය පිළිබඳ නිරීක්ෂණයන් මෙයට ඇතුළත් වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ ස්ථාන මාරුවී ගිය සේවකයින්ගේ සේවක ණය රු.119,295 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එය 2016 වර්ෂයේ සිට පැවැත එමින් තිබුණි. | ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | සභාවේ ගණකාධිකාරි තනතුර වර්ෂ 12 කට අධික කාලයක සිට පුරප්පාඩු වී පැවැතුණි. කෙසේ වෙතත්, ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගණකාධිකාරිවරයෙකු බඳවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඇ) | සභාවේ ලේකම් තනතුර සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු විය යුතුය. කෙසේ වෙතත්, ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලේකම්වරයෙකු බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඈ) | විගණිත දිනය වන 2019 මැයි 17 දින වන විටත් කළමනාකරණ සහකාර, සෞඛ්‍ය සුපරීක්ෂක, පවුල් සෞඛ්‍ය සේවිකා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, භාෂා පරිවර්තක,පුස්තකාලාධිපති, තාක්ෂණික නිලධාරී, වෙළඳපොළ සුපරීක්ෂක, යන්ත්‍ර ක්‍රියාකරු, ආදායම් පරීක්ෂක, වඩු කාර්මික හා යන්ත්‍ර අලුත්වැඩියාකරු ආදී තනතුරු පුරප්පාඩු වී තිබුණි. | - | පිළිතුරු ලබා දී නොමැත. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු කඩ කාමර 390 කින් කඩකාමර 111 ක් 2014 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණු අතර කඩ කාමර 47 ක් 2018 වර්ෂයේදී | එම කඩ කාමර කුලියට දීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| | කුලියට ලබා දී නොතිබුණි. එසේ වුවත්, සභාව විසින් එම කඩකාමර මේ දක්වා කුලියට දීමට කටයුතු කර නොතිබුණි. කඩ කුලී ලෙස 2018 වර්ෂය සඳහා සභාව විසින් රු.19,738,464 ක් උපයා ගෙන තිබුණි. | | |
| (ආ) | සභාව විසින් අවසන් වරට දේපළ තක්සේරු කර තිබුණේ 2010 වර්ෂයේදී වන අතර එම වර්ෂයේ පැවැති වාර්ෂික වටිනාකම පදනම් කර ගනිමින් තක්සේරු බදු අයකර තිබුණි. නමුත්, වර්තමානයේ සමහර ගොඩනැගිලි බවත් කර හා අලුත්වැඩියාවන් සිදුකර තිබුණි. කෙසේ වෙතත්, දේපළ නැවත තක්සේරු කර නිවැරදි වාර්ෂික වටිනාකම තීරණය කිරීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. | දේපළ තක්සේරු කර තක්සේරු බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

## 3.5 වත්කම් කළමනාකරණය

## 3.5.1 නිෂ්කාර්ය / ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු වාහන 17 ක් වර්ෂ 01 සිට 10 කාලයක් සභා පරිශ්‍රයේ නිෂ්කාර්යව පැවැති අතර ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණය කිරීමට හෝ භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | නගර සභා බල ප්‍රදේශයේ පවතින වීර්නගර් ප්‍රදේශයේ පිහිටි රෝහල්වලින් බැහැර කරන අනතුරුදායක අපද්‍රව්‍ය පිළිස්සීමේ අරමුණෙන් පිළිස්සීමේ යන්ත්‍රයක් ස්ථාපිත කිරීමේ කටයුතු 2015 වර්ෂයේදී ආරම්භ වී 2017 වර්ෂයේදී නිමකර තිබුණි. මේ සඳහා වැය කළ වියදම රු.5,595,830 ක් විය. කෙසේ වෙතත්, මෙම පිළිස්සීමේ යන්ත්‍රය 2019 මැයි 17 දින වන විටත් නිෂ්කාර්යව පැවැතුණි. | ඉතා ඉක්මනින් පියවර ගෙන නව ස්ථානයකට මාරු කර භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඇ) | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් 2017 වර්ෂයේදී නගර සභාවට අයත් පවර් ස්ටේෂන්හි පිහිටි ඉඩම් හා වෙළඳ | එම දේපළ භාවිතා කිරීම සඳහා කටයුතු කළ යුතු | පිළිතුරු ලබා දී නොමැත. |

| | | |
|---|---|---|
| ගොඩනැගිලි භාර දී තිබූ නමුත් එය ඵලදායි ලෙස භාවිතා කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | වේ. | |

### 3.5.2 වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අනුව ඌනතා අයිතමයන් 2077 ක් සහ අතිරික්තය 139 ක් හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද, විගණිත දිනය වන විටත් කළමනාකරණය විසින් අවශ්‍ය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එසේම නගර සභාව විසින් සමක්ෂණ වාර්තාවේ නිර්දේශද ක්‍රියාත්මක කර නොතිබුණි. | වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

## 3.6 ප්‍රසම්පාදන

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

### 3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය

#### 3.6.2.1 කෝනේෂ්වරන් කෝවිල් පාරේ, මැක්ගයිසර් පිටියේ වැට ඉදිකිරීම

2017 අගෝස්තු 21 දින මැක්ගයිසර් පිටියට වාහන ඇතුල් වීම වළකාලීම සඳහා නගර සභාව විසින් ප්‍රජා මධ්‍යස්ථානයකට වැටක් ඉදිකිරීම සඳහා රු.1,207,850 කට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කෙරේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 දෙසැම්බර් 22 දිනැති ගෙවීම් බිල්පත අනුව කාර්යයන් සතුටුදායක ලෙස සම්පූර්ණ කර ඇති බවට සහතික කරමින් GI පයිප්ප කනු 85 ක් සහ GI පයිප්ප මීටර් 300 ක් සඳහා රු.567,350 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ප්‍රජා මධ්‍යස්ථානය එකතුව රු.304,430 | වැඩිපුර ගෙවා ඇති මුදල් කොන්ත්‍රාත්කරුගෙන් ආපසු අයකර ගත යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| | ක් වටිනා GI කණු 58 ක් සහ GI පයිප්ප මීටර් 90 ක් පමණක් සවිකර තිබුණි. මේ අනුව, GI කණු 27 ක් සහ GI පයිප්ප මීටර් 210 සඳහා රු.262,920 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |
| (ආ) | ගිවිසුම අනුව, කොන්ත්‍රාත්තුව 2017 නොවැම්බර් 20 දිනට ප්‍රථම නිම කළ යුතුව තිබුණි. එසේ වුවත්, 2019 මැයි 17 දින වන විටත් කොන්ත්‍රාත් කාර්යයන් අවසන් කර නොතිබුණි. | ප්‍රමාද ගාස්තු අයකළ යුතු වේ. | පිළිතුරු සපයා නොමැත. |
| (ඇ) | ළමා උද්‍යානය සංවර්ධනය කිරීමේ අරමුණෙන් නගර සභාව විසින් තනි ඔංචිල්ලා සහ ද්විත්ව ලිස්සන ඔංචිල්ලා (double swing slider) රු.235,000 කට 2018 පෙබරවාරි 23 දින මිලදී ගෙන තිබුණි. ලිස්සන ඔංචිල්ලා සවිකර නොතිබීම නිසා 2019 මැයි 16 දින වන විටත් මේවා නිෂ්කාර්යව භාවිතයෙන් පැවැතුණි. | වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කළ යුතු වේ. | පිළිතුරු සපයා නොමැත. |

## 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාර අභ්‍යන්තර විගණන ඒකකයක් නගර සභාව විසින් ස්ථාපිත කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

## 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාර විගණන හා කළමනාකරණ කමිටු නගර සභාව විසින් ස්ථාපිත කර නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු ඒකකයක් ස්ථාපිත කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

**4.3 පිළිතුරු නොලත් විගණන විමසුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මලාපවහන ජලය පිරිසිදු කිරීම හා පරිසරයට මුදාහැරීමේ අරමුණින් 2014 වර්ෂයේදී රු.4,044,907 ක පිරිවැයකට මලාපවහන පිරිසිදු කිරීමේ පිරියත ඉදිකර තිබූ අතර එහි අත්‍යවශ්‍ය කාර්යය වන පිරියතහි කොහු ඇතිරීම සිදුකර නොතිබුණි. එබැවින්, පිරිසිදු කිරීමෙන් තොරව පිරියත හරහා මලාපවහන ජලය පරිසරයට මුදා හැර තිබුණි. ඒ අනුව, අපිරිසිදු ජලය මඟින් වන පරිසර දූෂණය වළක්වා ගැනීමේ අරමුණ මෙම පිරියතෙන් ඉටු වී නොමැති අතර ඒ සඳහා වැය කරන ලද වියදම නිශ්ඵල වියදමක් බවට පත් වී තිබුණි. | සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් කළ යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | නගර සභාවට අයත් ඉඩම් පුද්ගලික අංශයට භාරදීමට කිසිදු බලයක් සභාපතිවරයාට නොතිබුණද, 2008 වර්ෂයේදී හිටපු සභාපති විසින් සභාවට අයත් පර්චස් 3,212 ක ප්‍රමාණයක ඉඩම් පුද්ගලයන් 576 දෙනෙකුට භාර දී තිබුණි. මෙම කරුණ සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා 2010 අගෝස්තු 11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරුවරයකු ප්‍රධාන අමාත්‍යවරයා විසින් පත්කරන ලදී. ඔහුගේ වාර්තාව අනුව, නගර සභාව විසින් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කර නොතිබූ බව තීරණය කර තිබුණි. එබැවින්, 2015 මැයි 26 දින පවත්වන ලද පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී තීරණය කළ පරිදි මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ඉදිරිපත් කිරීමට ලබා දුන් නියෝගයට අනුව, ප්‍රධාන අමාත්‍යවරයාගේ ලේකම් විසින් සභාපතිත්වය දරන කමිටුවක් පත් කර තිබුණි. කෙසේ වුවද, අදාළ කමිටුව විසින් 2018 ජුනි 29 වන විටත් මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සභාපතිවරයාට එරෙහිව නීතිමය | මේ සම්බන්ධයෙන් කඩිනම් පියවර ගත යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු කිරිම තවදුරටත් ප්‍රමාද වී පැවතුණි. | | |
| (ඇ) | සන අපද්‍රව්‍ය බැහැර කරන ලද ඉඩම අලිඇතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා රු.618,858 පිරිවැයකට සභාව විසින් 2014 වර්ෂයේදී විදුලි වැටක් ඉදිකර තිබුණි. කෙසේ වුවද, ඒ සඳහා විදුලි බලය සපයා නොතිබූ බැවින්, අලිඇතුන් විසින් විදුලි වැටට හානි සිදුකර තිබූ අතර දැනට ඉඩම වටා විදුලි වැටක් නොමැත. සන කසල පරිභෝජනය සඳහා අලිඇතුන් පැමිණෙන බවද නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් කඩිනම් පියවර ගත යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. |